ජන ගී රසය
ගීතයෙන් අපට පුදන
අපේ රචකයා



වචන දහස් ගණනක් ලු
අකුරු පනස් හතරක් ලු
අපේ හෙවිසර
ඇසිඳ ගත්ත වචන වලින්
අයි දොඩවන්නේ
තම දෙත තම දෙත තනා
රට පත්තෙට හැසිරෙන්නේ
බහ බානෙට දොඩවන්නේ සිංහිරිසියේ
අහස් මුලක් නැතිව හිඟින් කොළඹෙවන්නේ

සිසිර වසින් ලියන ලද ගීත ඇතුළත් ගී පද සංග්‍රහයක් සිසිරගේ කුරුටු ගී නමින් පසුගිය දා එළි දැක්වුණි. සිසිර වසින් වටින් වර ලියන ලද ගීත අනුවක් මේ පොතට අතඟළත් ය. විවිධ කෝණ වලින් විවිධාකාරයේ භාෂා රටා උපයෝගී කර තනිමින් තව මඟක් සොයා යන්නට සැරසෙන ගීත රචකයෙකු ලෙස අපට ඔහු හැඳින්විය හැකි ය. මේ සිසිර සමග කළ කෙටි පිළිසඳරක්.

සිසිර කොහොමද ගීරචනා කළාවට පෙළඹුණේ?

මම ගීරචනා කලාවට පෙළඹුණේ ආනන්ද විද්‍යාලයෙන් කියලා කිව්වොත් හිඟවැරදියි. ආනන්දලට ඇතුළුවුණාට පස්සෙ පොඩි පොඩි සමිති සමාගම වලට එකතු වුණා හැම සමිතියකම අභිප්‍රායය තමයි වැඩිපුර සිසුන් බඳවාගැනීම. එහෙම වුණොත් කොයෙක් වරපුසාද පාසලෙන් ලැබෙනවා. අපිත් "ආනන්ද නුවණ" කියලා සමිතියක් පටන් ගත්තා. මේක ජනප්‍රියය කරවන්න හිත්ති පුවත් පතක් පටන් ගත්තා. මේ හිත්ති පුවත් පතට චිත්‍ර ඇන්දෙ මම. ඊට පස්සෙ චිත්‍ර වලට අමතරව පොඩි තිසැදැස් ලියන්න පටන් ගත්තා. ඒ එක්කම මගේ මිතුරෙක් ගිටාර කපිල ජනක් කියලා. ඔහුත් මාත් කවිවලින් ලිපි ලියන්න පටන් ගත්තා. එහෙම තමයි මේ පසත්තට පෙළඹුණේ. එදා ඉඳලා දැක්ක උවමනාවක් තිබුණා ඇඳුත් යමක් කරන්න.

මුළින්ම ලියැවුණ ගීතය කුමක්ද?

මං මුළින්ම ගොඩාක් ගීත ලිව්වා. නමුත් මුළින්ම ප්‍රචාරය වුණේ "හද්දා නවදා බසෙගම වැසඋපන් හත්වෙනි ඉල් මාසේ හද්දා තනියේ පාලුව නහපන් හත්වෙනි පොඩි නසෙන්" ගීතයයි.

මෙම ගීතය 1996 සරළු ගී වැඩ සටහනකින් ප්‍රචාරය වුණා. මෙම තනුව යොදා ගායනා කළේ විජේවීර රත්නායකයන්. එය මගේ සිහිගයක් සැබෑ වීමක්. ඒ කාලේ මා දැඩි ලෙස ආදරය කළ දැඩි ලෙස අගය කළ ගායකයෙකුගේ මුළින් එම ගීය ප්‍රචාරය වීමයි. ඉන්පසු විජේවීර රත්නායක මහතා සමග මගේ දැඩි මිත්‍ර දමක් හොඳ නැගුණා. ඔහුත් මගේ ගීත රචනා ශෛලිය වර්ධනය කරන්නට උපකාර කළ කෙනෙක්.

ඔබේ ගීත රචනා වලට ජන කවි සහ ගැමි වහර වැඩිපුර උපයෝගී කරගන්න පෙළඹුණේ ඇයි?

අපේ භාෂාව තරම් පෝෂණය වෙච්ච තවත් භාෂාවක් ලෝකයේ නැහැ කිව්වොත් හිඟවැරදියි. එකම අර්ථය දක්වන්න වචන කොපමණ තරම් අපේ භාෂාවේ තියෙනවද? ඒ වගේම අපේ පත පොත සංදේශ කාව්‍ය කොපමණ විශිෂ්ඨද ද? බොහෝ වේලාවට මං මේ සියලු දේ ප්‍රතිශීලනය කර එයින් අත්දැකීම් ලබා ගන්නවා. ජන කවිය අපි උපන් දා සිට අපේ ළේ සමග බැඳ වෙලා තියෙනවා. මේ කුසින් බිහිවුණ දා සිට අපව හඳුවන්නේ ජන කවියයි. ඒ එක්කම අපේ ඕ දිසා-නායක, රත්න ඕ ජනනායක. පියසේන කහඳමගේ, ගමින්ද දසුපොත යන රචකයන් මට මේ වෙලාවේ මතක් වෙනවා. මවුන් ඒ දාවස් වල දිවයින පුවත් පතට ලියපු ලිපි මා පෝෂණය කළා කිව්වොත් හිඟවැරදියි. ඒ එක්කම මගේ පියා මැද මහනුවර මව කැඟලුණ මග අපදෙන් අත්සාවේල්ලෙ පාසල් ගියේ මරදානෙන නැවතිලා හිටියේ කිරුළපන රැකියාව කළේ ඇඹලිපිටිය දෙගිඅත්තකණ්ඩිය මිගමුව වගේ පළාත් වල මෙවැනි පළාත් වල පිටත්වන්න ලැබීමම මගේ භාෂා ඥානය වර්ධනය වෙන්න හේතුවක් වුණා. ඒවා මම මගේ ගීත වලට යොදා ගත්තා.

ඔබ ගීතයක් ලියන්න අනුගමනය කරන ක්‍රියා පිළිවෙත කොහේද?

මම හැමවිටම ගීතයක් රචනා කරනකොට හිතන්නෙ එයින් පහිවිධයක් සහ කතාවක් කීම. මම ගීතයක් ලියනකොට හැම විටම මගේ හිතේ අදෙපැත තනුවක් අනුව තමයි මම ලියන්නෙ. විරිතක් හෝ තාලයක් මට තියෙනවා. ඒ අනුව ලියන එක මට පහසුයි.

අනුමෙන් නිර්මාණය වන ගීත ගැන ඔබේ අදහස කුමක්ද?

සමහර ගීත දිනා බලපුවහම වචන ටිකක් විතරයි. අපි දන්නවා කාලයෙන් කාලයට අවර ගණයේ ගීත පද අතඟළත් රචනා බිහිවෙනවා. නමුත් එම ගීත රදාපවත්නින්නෙ නැහැ. මාසයකින් දෙකකින් හැමෝටම අමතක වෙනවා. නමුත් හොඳ ගීත වලට එහෙම වෙන්නෙ නැහැ. සමහර ගීත තියෙනවා අපි කතාවට කියන්නෙ ත්‍රිවිධ ප්‍රසිද්ධ බස් වල අදහස ගීත කියලා. නමුත් සරළ සුමට වචන වලින් රචනා වුණේ අතරින් පතර ගැමුරු අර්ථ ගැබ් වෙලා තියෙනවා. මෙතක බිහිවුණ සමහර ගීත රචකයෝ ගැමි වහර ගැමි කම උපකාරයට ලක්වන ගීත ලියනවා. ඒක හරිම කණගාටුවට කරුණක්. මට මතක් වෙනවා එක් දවසක අප අතරින් නැසී ගිය කපුගේ මහතා මට කිව් කතාවක්. "ගැමි වහර පාවිච්චි කළාට කමක් නැහැ. ගැමියන් උපහාසයට අපහාසයට ලක් කරන්න එපා" කියලා. මට ඒ වචන පෙළ ගැලක කෙටු අකුරක් වගේ හිතේ රැඳී තියෙනවා.

ඔබ රචනා කළ ගීත අතර ආන්දෝලනයට ලක්වුණ ගීත තියෙනවා නේ ද?

ඔව් ජානක වික්‍රමසිංහ ගායනා කළ "නුඹෙ සිටිත්තියට" කියන ගීතය ඒ ගැන හුගක් දෙනෙක් කතා කළා. සිටිත්තිය සිහනව. පයිත්තියන් -(වීනළ) කියන්නෙ ද්විඛ භාෂාවෙන් අපේ බස් වහරට එක් වූ වචන. මං ඒවා මේ ගීතයට යොදා ගත්තා. මං මුළින්ත කිව්වෙ මං හැම සිස්සෙම උත්සාහ කරන්නෙ ඇඳුත් යමක් කරන්න කියලා.

නුඹෙ සිටිත්තියට
මුලු වැඩියක්කියම
හිත් පයිත්තියන් වී නගේ
ඉස කුඩුවව දාගෙන වගේ

ජන ගී අනුමෙන් ගීත ලියන එක ඉතාමත් අමාරු කාර්යයක් නේද?

ඔව් මං හිතන්නෙ. ජන ගී ගායනා වල බොහෝ විට දකින්න ලැබෙන්නෙ සීමිත ස්වර මාලාවක් හා ඒකාකාරී තනුවක්. ඉතින් මම හැමතිස්සෙම උත්සාහ කරන්නෙ මෙම සීමිත ස්වර රටාවට හා ඒකාකාරී බවෙන් මිදිලා විසඳි පරාසයක පද මෙහෙයවන්නට එයින් විත්ත රසය මවන්නට. මං හිතන්නෙ මගේ සමෙර නිර්මාණ ගැන ප්‍රවාණ ගීත රචකයන් කතා කරන්නට මුළ් වුණේ මේ කරුණ බව.

ඔබගේ ගීත රචනා ශෛලිය දියුණු කර ගන්නට උපකාර වුණ අය කවිද?

මම මුළින්ම මතක් කරන්න ඕන ලයනල් රංවල මහත්මා. ඔහුගේ මග පෙන්වීම මට මතක් රැකලුක් වුණා. ජන ගී ආභාෂයෙන් ලියූ ගීත රාශියක් ලියවුණේ රංවල මහතායි. සමෙර විට ඔහුගේ නතු වලට මට ගීත ලියන වුණ අවස්ථා එමයි. ගම අවුලසැදිඳැද ප්‍රසංගයේ දී ගැයෙන ගීත කීපයක්ම මාවිසින් රචනා කළ ගීත.

සුදුවට පිරුවර අදඳගෙන එන්නේ
ආනනට සිලෙට මුළටම ඉන්නේ
වයසට යනකොට මොනවද වෙන්නේ
කට වටකර වැට කොහොම බඳින්නේ

ජනකවියෙන් බොහෝවත් ඔබ ගීත වීනළ සංඛනයක් ලියලා තියෙනවා නේද? ඒ ගැන වැඩි කතා නොකරන්නෙ ඇයි?

කතා කරනවා. මම වැඩි කැමෙත්තක් දක්වනවා ඒ පැත්තට. නමුත් ජන කවිවලින් බැහැර වූ නිර්මාණ විශාල සංඛනයක් ජනප්‍රිය වී තිබෙනවා.

කවකලුවෙන් රවුම් කළා
ඇඳුනේ නුඹෙ රවුම් මුහුණ
අඩිකෝදුව හරස් කළා
ඇඳුනේ නුඹෙ දිගටි නහය
පන්තියෙ අන්තිම පේළියෙ
බංකුවෙ මම ඇන්දැ රූප
නෙත් තොපියා මං දිනාම
බලා ඉන්නවා

ඉතින ගීතය පාසල් ප්‍රේමය ගැන ලියැවුණ අදාරු ගීතයක් මෙය පසුමිම් වුණ කතාවක් තියෙනවද?

තියෙනවා. නමුත් ඒක මගේ ප්‍රේම කතාව නෙවෙයි. පාසල් වියේ දී අපි හැමෝටම මේ වගේ අත්දැකීම් තියෙනවා. මං මුළින්ම කිව්වා වගේ සරළ වචන මාලාවකින් කතන්දරයක් කියන්න පුළුවන්. ඔබ වුණත් මේ ගීත පොතේ තියෙන ගීත අතුරෙන් මේ ගීතයේම විශේෂවයක් දුටුවේ මොකක් හරි අත්දැකීමක් තිසා නේද?

සොපමණ හොඳ රචනා වුවත් සමහර වීර ජනප්‍රිය වෙන්නෙ නැහැ නේද?

ගීතයක් ජනප්‍රිය වෙන්න හොඳ තනුවක් හොඳ සංගීත සංයෝජනයක් ගායනා ශෛලියත් එකතු වෙන්න ඕනෙ. මේ සියල්ල හරියට දම්වැලක පුරුකක් වගේ. එකක් හෝ අඩුවුවොත් ජනප්‍රිය වෙන්නෙ නැහැ. හොඳ ගීත රචනා තියෙනවා හොඳ සංගීත සංයෝජනයක් හොඳ ගායනයක් නැති තිසා ජනප්‍රිය නොවුණ.

ශ්‍රී ලංකාව සිට ඔස්ට්‍රේලියාවට පැමිණ අදිංචි වීම ඔබගේ නිර්මාණවලට බලපෑවෙ කොහොම ද?

අත්තටම ලංකාව තුළ ඉන්නකොට භාෂාව අතින් අපි හැමවිටම පෝෂණය වෙනවා. මේ පරිසරයේදී වචන එනවා අඳුයි. මොකාවා කරන්නද? නමුත් මෙහි ගායන ශිල්පීන්ගේ මම හුගක් ගීත රචනා කරලා තියෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. ඒ අයත් ඒ ගැන ප්‍රශංසා මුළකෙන් කතා කරනවා.

ඔබ දියු ඔබ සඟබඳ ගීතය

ඒක හරියට දරුවන් කීපදෙනක් ඉන්න පියයකුගෙන් වැඩිපුත්ම සැමතී දරුවා කවිදැයි අහනවා වගෙයි. මං මගේ හැම ගීතයකටම කැමතියි. නමුත් මව වෙනුවෙන් ලියූ ගීතයට විශේෂ සැමෙත්තක් තියෙනවා.

කිරි මදුවැල් කිරි වරුවත්
කිරි කැරියට කිරි එරුණා
නුඹෙ දෙතෙන් අම්මේ
කිරි කවිවයෙන ණාය ගෙවනා
කිරි සිහිනය ඉතිරෙනවා අම්මේ

සිසිරගේ කුරුටු ගී පොත තුළ මෙවැනි හැඳුම් ගී රැසක් අඩංගු වෙයි. මේ ගී විදාහපාන්නේ ප්‍රතිභාපූර්ණ ගීත රචකයෙකුගේ නිර්මාණශිල්පීවයේ අපූර්වත්වය යයි මම සිතමි. ගීතයට ඇඳුම් කරන ඔබට මේ පොතෙහි ඇති අගය මනාව වටහෙනු අතක.

ශ්‍රීනාත් මද්දුමගේ

නැවුම් පුවත් හරවත් කතා බත
දෙස් විදෙස් කැලිත සිද්ධීන් ඕදුරු සංගීතය

සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ

සේදාංධ ලියම්

ඇත්තමයි සේදාරා - මෙගේ නං හරි ශෝක !
මගක රෙයි මට ලුබන -- ඕය දුසේ පනාවක්,
පුංචිකාලේ ගමේ - කොටිළි පසවල වළිදි
දැකපු ලාබ හපනකම්- මොනතරම් අපරාදද

යකා නටන විරිදු - ගුරුකොන්සොට වක
දෙකයි දුම්මල ගහුවෙ - දාවන පන්දම් වළට,
අරන් දුම්මල ගොවිට -- දූව දූවා හතර අත
දා ඉතුරු ගහා ගහා - කරලු ගුද්දැක පොඩිදද?

අපි ඇවිත ගේ රාවේ - කරන්නත් ඒ වැඩකි
සුද්දරාගය පන්දමට -- ලුම් වැකිත එක තමයි,
කිකිම රෙදකක් කැපුව - එයා පලලෝ ගොදදදින්
එකම පොම්ලෙග තමයි - අපි මෙහෙ හරන්නනත,

ඔය ගොගරත ඒ එරගයි - දිවිළුයි සැදිකයි
පොඩිකම අතඳපු ඉලකාර - එළුන්දු කලෙන්තියි,
කිකාපුම රට දකට - සේදරං ලේක නං,
යොගහකරේ ආවොත්කි - පොඩි එකක් නං ඉවර !

උගන්කම මීගත නෑ - එඬකාරයාගෙ උණ
හඳපත්ත රෙඩියුමේ - ගොදාර එඬකිස දළා,
ලියන්න ඉගෙනින්න - පළපුරුද්දැක් අතයයි
පුරා අඳුරුදු තිකක් - යකාට දුම්මල දී !

ශ්‍රියාති පෙරෙරා

සඳුන්වඩනක්